**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2275 - SRI) - 2013**

---

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ආ.ස.බැ) අතර එළඹි ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2007 ජූනි 06 දිනැති අංක 2275 SRI දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ස.ජ.ම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. 2003 අගෝස්තු 18 දිනැති අංක 1993 SRI - (එස්එෆ්) ණය ගිවිසුම යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත එජඩො මිලියන 85.6 ක් ශ්‍රී ලංකා රජයේ දායකත්වයද ඇතුළුව අනුමත කර තිබුණි. උතුරු මැද පලාතේ නාගරික ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ පහක 969,000 ක් වන ජනතාවට සුරක්ෂිත ජලයද 171,500 ක් වන ජනතාවට සනීපාරක්ෂාවද සැපයීමත් ජල කේන්ද්‍රික ආයතන සවිබල ගැන්වීම මගින් සුරක්ෂිත ජලය සැපයීමේ ධාරිතාව වැඩිකිරීමත් ව්‍යාපෘතියේ අරමුණු වේ. එහි ආරම්භක මිල ඇඟයීමේ සිට අතාත්වික මුළු පිරිවැය ඇස්තමේන්තු කිරීම සහ මිල ඉහළ යාම හේතුවෙන් අම්බලන්තොටදී වළවේ ගඟ හරහා ලවන බාදකය ඉදිකිරීම සහ බෙදාහැරීමේ නල එලීමට හා උස් ජලකණු ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් මූලික ප්‍රාග්ධනිත සම්පත් (OCR) වලින් අතිරේක ණය මුදලක් (ණය අංක 2275 SRI) අනුමත කර තිබුණි.

අතිරේක ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 19.1 න් එජඩො මිලියන 13.5 එනම් සියයට 70.6 ක් ආසියානු සංවර්ධන බැංකුව මූල්‍යායනය කිරීමටත්, එජඩො මිලියන 5.6 එනම් සියයට 29.4 ක් ශ්‍රී ලංකා රජය (GOSL) විසින් මූල්‍යයනය කිරීමටත් එකඟ වී තිබුණි. පිරිවැය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 21.5 දක්වා වර්ධනය වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය එජඩො මිලියන 8 දක්වා වර්ධනය වී තිබුණි. 2010 ජූනි 30 වන විට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2014 ජුලි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද

යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම්ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) **ණය** යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව,

(ඈ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන
-----------------

4.1 මූල්‍ය කාර්යසාධනය
-----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 218,410,808 ක් සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,184,123,100 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම්, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ සමුච්චිත වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **අයිතමය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | **රු.** | **රු.** |
| සිවිල් වැඩ | 112,864,257 | 134,289,016 | 1,442,110,987 |
| උපකරණ සහ ද්‍රව්‍ය | 105,545,551 | 178,777,855 | 690,436,598 |
| පොලී අයකිරීම් (අතිරේක) | - | 11,064,422 | 51,575,515 |
| එකතුව | 218,409,808 | 324,131,293 | 2,184,123,100 |

5. විගණන නිරීක්ෂණ
---------------------

5.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 5 අනුව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගෙවීම මත සියයට එකක් කොන්ත්‍රාත් ඇප අරමුදල් බදු (CIGFL) ලෙස අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, ව්‍යාපෘතිය එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව 2013 වර්ෂය තුළ සිවිල් වැඩ, උපකරණ සහ ද්‍රව්‍ය සඳහා රු.මිලියන 268 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, ලැබීම් සහ ගෙවීම් ගිණුමට අනුව සත්‍ය ප්‍රමාණය රු.මිලියන 236 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සිවිල් වැඩ, උපකරණ හා ද්‍රව්‍ය සහ අත්තිකාරම් රු.මිලියන 32 ක් වැඩියෙන් දක්වා තිබුණි.

6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය
--------------------------------------

6.1 අරමුදල් උපයෝජනය
----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යයනය සහ අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 12.80 | 1,442.66 | 124.50 | 123.82 | 11.4 | 1,303.48 |
| ශ්‍රී ලංකා රජය | 8.00 | 902.30 | 157.32 | 112.37 | 7.0 | 833.18 |
| | 20.80 | 2,344.96 | 281.82 | 236.19* | 18.4 | 2,136.66 |

* උපචිත වියදම්වල බලපෑම හේතුවෙන්, මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යාවන් ඉහත දැක්වෙන සංඛ්‍යාවන් වෙනස්වේ.

6.2 භෞතික ප්‍රගතිය
--------------------

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම් දෙකක් යටතේ වූ වැඩ ප්‍රමාණවත් ලෙස සම්පූර්ණ කර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී තිබුණි. රු.1,209,424,076 ක පිරිවැයක් දරමින් අම්බලන්තොට වලවේ ගඟ හරහා ඉදිකරන ලද ලවන බාධකය ඉදිකිරීම, සම්පූර්ණ කිරීම සහ පැවරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ සැලකිය යුතු ප්‍රමාණයක් සම්පූර්ණ කර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නිමකර භාරදී තිබුණද 2013 නොවැම්බර් 25 දින නිකුත් කරන ලද භාරදීමේ සහතිකයෙහි අඩුපාඩු 32 ක් අනාවරණය විය. එම අඩුපාඩු භාරදීමේ සහතිකය නිකුත්කළ දින සිට මාස තුනක් ඇතුළත නිවැරදි කළයුතු වුවද, 2014 ජුලි 31 දක්වා එම නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.